# මධ්‍යම පළාත් සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ ඇතුලත් මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මධ්‍යම පළාත් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **පළාත් සභා අරමුදල් ගිණුම**

පළාත් සභා අරමුදල් ගිණුම 2012 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

(ආ) **අනෙකුත් ගිණුම්**

සමාලෝචිත වර්ෂයට අදාලව 2012 මාර්තු 31 දිනට මධ්‍යම පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | 2011 වර්ෂයට අදාල | | |
|---|---|---|---|
| | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| i. වත්කම් හා බැරකම් ප්‍රකාශය | 01 | 01 | - |
| ii. විසර්ජන ගිණුම් | 33 | 33 | - |
| iii. ආදායම් ගිණුම් | 02 | 02 | - |
| iv. පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 66 | 66 | - |
| v. වාණිජ අත්තිකාරම් ගිණුම් | 06 | 04 | 02 |
| vi. අරමුදල් ගිණුම් | 01 | 01 | - |
| vii. ප්‍රඥප්ති ගිණුම් | 01 | 01 | - |
| viii. පළාත් සභා මන්ත්‍රී අත්තිකාරම් ගිණුම් | 01 | 01 | - |
| | 111 | 109 | 02 |

=== === ===

1.2.2 **<u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>**

පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉතිරි තොග අයිතම 213 ක වටිනාකම ගිණුම්ගත නොවීම, නියමිත ආකෘතියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් නොකිරීම හා අධිකාරිය ආරම්භයේ පැවරුනු වත්කම් නිවැරදි ක්ෂය ප්‍රතිපත්තියක් අනුව ක්ෂය කිරීමට කටයුතු නොකිරීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය.

1.2.3 **<u>නොසැසඳූ පාලන ගිණුම්</u>**

ගිණුම් විෂයයන් 11 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.460,051,860 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.453,071,939 ක් විය.

1.2.4 **<u>බැංකු සැසඳුම් ප්‍රකාශ</u>**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පේෂකර්ම දෙපාර්තමේන්තුවට අයත් බැංකු ගිණුමක වර්ෂ 01 කට අධික කාලයක සිට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ ප්‍රමාදයන් විය.

(ආ) මාස 06 ක කාලයක් ඉක්මවා උපලබ්ධි නොවූ තැන්පතු රු.2,413,290 ක් සම්බන්ධයෙන් බැංකුවෙන් විමසා පසුවිපරම් කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුම් 04 කට අදාලව හඳුනා නොගත් හර රු.199,632 ක් වූ අතර, බැංකු ගිණුම් 10 කට අදාල හඳුනා නොගත් බැර රු.748,551 ක් විය.

1.2.5 **<u>ගෙවියයුතු ගිණුම්</u>**

අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.268,613 ක් විය.

1.2.6 **<u>අග්‍රිම ගිණුම්</u>**

2011 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකල රු.4,151,773 ක් ව අග්‍රිම හර ශේෂ තිබුණි.

1.2.7 **<u>පොදු තැන්පත් ගිණුම්</u>**

මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකල 2011 දෙසැම්බර් 31 දිනට අවු.02 ක කල් ඉකුත්වූ පොදු තැන්පත් ගිණුමේ ශේෂ වටිනාකම රු.67,074,965 ක් විය.

1.2.8 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **පිළිතුරු නොලත් විගණන විමසුම්**

2011 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 91 කට පිළිතුරු සපයා නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කල හැකි ගනුදෙනුවල වටිනාකම රු.99,777,048 ක් විය.

(ආ) **තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,014,847,430 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) **ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම**

එකතු වටිනාකම රු.82,957,555 ක් වූ ගෙවීම් වවුචර් 125 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.2.9 **අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (i) **ආයතන සංග්‍රහය** | |
| xix පරිච්ඡේදයේ 6.14 හා 7.1 වගන්තිය | මහනුවර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු රජයේ නිවසක ප්‍රධාන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයකු 2010 ජූලි 16 දින සිට පදිංචි වී 2010 ඔක්තෝබර් සිට විශ්‍රාම ගොස් තිබුණි. 2011 දෙසැම්බර් වන විටත් එම නිවස ඔහු විසින් ආපසු භාරදී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| xii පරිච්ජේදයේ 1.3 වගන්තිය | නාඋල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් කාර්ය මණ්ඩලයේ 36 දෙනෙකු සහ අඹන මහා විද්‍යාලයේ ගුරුභවතුන් 23 දෙනෙකු 2011 වර්ෂය තුළ විධිමත් අනුමැතියකින් තොරව අනියම් සහ විවේක නිවාඩු දින 212 ක් සහ රාජකාරි නිවාඩු දින 79 1/2 ක් ලබාගෙන තිබුණි. |
| xix වැනි පරිච්ජේදයේ 5 වන වගන්තිය | නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සතු නිවසකින් රු.101,712 කද, උපලේඛනගත නොවූ රජයේ නිවාස 02 කින් රු.114,331 කද, මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සතු රජයේ නිවාස 04 කින් රු.205,782 කද හා උඩුදුම්බර රෝහලේ රජයේ නිවාස 05 කින් රු.134,227 කද වශයෙන් එකතුව රු.556,052 ක නිවාස කුලී අයකරගෙන නොතිබුණි. |

(ii) <u>මුදල් රෙගුලාසි</u>

| | |
|---|---|
| මු.රෙ.104 හා 110 | 2003 සිට 2007 වර්ෂය දක්වා නුවරඑළිය ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ තොග වාර්තා මගින් අනාවරණය කරන ලද රු.11,180,068 ක තොග ඌනතා හානි ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් ලබාදීමට සහ ඉදිරි ක්‍රියාමාර්ග අනුගමනය කිරීමටද කටයුතු කර නොතිබුණි. |
| මු.රෙ.156(7) | පල්ලේකැලේ ආයුර්වේද නිෂ්පාදනාගාරයේ වියලි ඖෂධ තොග අවශ්‍යතාවය පිළිබඳ නොසලකා වැඩිපුර මිලදී ගැනීම හේතුවෙන් රු.2,200,876 ක් වටිනා වියලි ඖෂධ වර්ග 07 කට අයත් කි.ග්‍රෑ.1232 ක ප්‍රමාණයක් 2011 නොවැම්බර් 23 දින වනවිටත් භාවිතයෙන් තොරව ගබඩාවේ පැවතුණි. |
| මු.රෙ.264 | නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අදාලව අවස්ථා 14 කදී සිදු කරන ලද රු.399,939 ක් වටිනා ගෙවීම් මුදල් ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියක් මගින් තහවුරු කර නොතිබුණි. |

(iii) **මධ්‍යම පළාත්**

**<u>මූල්‍ය රීති</u>**

116(1)

(අ) මෝටර් රථ බලපත්‍ර ගාස්තු හිඟයකින් තොරව අයකර ගත යුතු වුවත්, මහනුවර, නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26 කින් 2011 සැප්තැම්බර් 30 දින වනවිට රු.54,288,621 ක මෝටර් රථ බලපත්‍ර ගාස්තු ආදායමක් හිඟහිටව පැවතුණි.

(ආ) මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක හිඟ ඉඩම් බදු ආදායම රු.651,853 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයවිය යුතු දීර්ඝ කාලීන බදු රු.3,149,420 ක් විය.

142.2

නිවාස සංවර්ධන අධිකාරිය සතු ජනසවි ගම අංක 28 දරන නිවස හා අංක 02 කෘෂි ගොවිපල සහිත ඉඩම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරාදීමට අධිකාරිය විසින් 2004 වර්ෂයේදී එකඟතාවය පළකර තිබුණද, පවරාගැනීම් කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් 2011 වර්ෂය වනවිට ප්‍රමාද ගාස්තු ලෙස රු.361,864 ක මුදලක් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිවාස සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි.

(iv) **<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>**

| | |
|---|---|
| 1994 ජුලි 01 දිනැති අංක 24/94 දරන චක්‍රලේඛයේ 2 ජේදය සහ 2001 ජනවාරි 15 දිනැති අංක 01/2001දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 2 ජේදය | රැස්කරනු ලබන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අරමුදල වෙත ඊලඟ මාසයේ 05 වෙනි දිනට ප්‍රථම යැවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අයකරන ලද රු.528,726,079 ක දායක මුදල් එම අරමුදලට නොයවා පළාත් සභා ආදායමට ගෙන තිබුණි. |

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.1 ජේදය | වාහනවල ඉන්ධන දහනය මාස 06 කට වරක් පරීක්ෂා කලයුතු වුවද, ඉඩම් දෙපාර්තමේන්තුව සතු වාහන 03 ක් හා මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 60 ක් සම්බන්ධයෙන් එම නියමය පරිදි කටයුතු කර නොතිබුණි. |
| 2009 මාර්තු 05 දිනැති අංක 10/2007 (II) දරන චක්‍රලේඛය | නිවාස පහසුකම් ලබාදී නොමැති ගරු අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් හට කුලී පදනම මත නිවාස ලබාදීම පිණිස ඉඩකඩ සැලසී තිබුණද, ඒ යටතේ නියෝජ්‍ය අමාත්‍යවරයකු හා සමාන ගණයට නොවැටෙන මධ්‍යම පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා සඳහා 2010 ජූලි 01 දින සිට 2011 අගෝස්තු දක්වා මසකට රු.26,650 බැගින් රු.293,150 ක නිවාස කුලී මුදලක් ගෙවා තිබුණි. |
| 1987 ජනවාර 05 දිනැති අංක 887 දරන චක්‍රලේඛය | නිවාස සඳහා ආර්ථික කුලිය වාර්ෂිකව තක්සේරු කළයුතු වුවද, මාතලේ අධ්‍යාපන කාර්යාලයට අයත් විදුහල්පති නිවාස 17 කින් 1998 වර්ෂය තුල තක්සේරු කර තිබූ ආර්ථික කුලී 2011 ඔක්තෝබර් තෙක්ම අයකර තිබූ අතර, පළාත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රෝහල් 02 ක සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල 01 ක රජයේ නිවාසවල පදිංචිකරුවන්ගෙන් 2009 සිට 2011 දක්වා ආර්ථික කුලී අයකර ගෙන තිබුණි. |

(v) <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u>

| | |
|---|---|
| 2004 පෙබරවාර 12 දිනැති අංක ඒඩීඑස්ර්සීජ්/එම්/අයි/එස්සී/4 දරන චක්‍රලේඛය | කාර්යාල වේලාව තුළ පවත්වනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ලබාගැනීමට අවකාශ සැලසී නොතිබියදී මගී ප්‍රවාහන සේවා අධිකාර්ය විසින් අවස්ථා 11කදී කාර්යාල වේලාව තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා රු.136,550ක දීමනා ගෙවා තිබුණි. |

(vi) <u>වෙනත් චක්‍රලේඛ</u>

| | |
|---|---|
| 2010 මැයි 25 දිනැති අංක 4/2010 දරන චක්‍රලේඛයේ 3 සහ 8(1) ඡේද | ගල්පාලම ගොවිපලේ අනියම් පදනම මත සේවය කරන කම්කරුවන් 10 දෙනෙකුගේ වැටුප්වලින් අවකරණය කර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් රු.151,600 ක් යැවීමට කටයුතු කර නොතිබුණි. |
| මධ්‍යම පළාත් ප්‍රවාහන කොමසාරිස්ගේ 2008 අගෝස්තු 18 දිනැති අංක: සිපිසි/සිඑම්/ටිආර්/312/3 දරන වාහන ආදායම් බලපත්‍ර ගාස්තු සංශෝධන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වැරදි ලෙස අර්ථ නිරූපනය කරමින් කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2008 ඔක්තෝබර් 08 දින සිට 2009 දෙසැම්බර් 30 දින දක්වා වාහන 8326 කට අදාල වාහන බලපත්‍ර ගාස්තු රු.3,234,446 ක් වැඩිපුර අයකර ගෙන තිබුණි. |
| 2006 මැයි 15 දිනැති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ මුද්දර බදු චක්‍රලේඛයේ 02 ඡේදය | අයකරනු ලබන මුද්දර ගාස්තු කාර්තුවක් අවසන් වී ඊළඟ මස 15 දන හෝ ඊට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු වුවත්, එයට පටහැනිව දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2011 අගෝස්තු සහ දෙසැම්බර් යන මාසවල අයකර තිබූ රු. 370,000ක් වූ මුද්දර ගාස්තු 2012 පෙබරවාරි 16 දින වන විටත් ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| 2011 ඔක්තෝබර් 26 දිනැති අංක 2001/28 දරන අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට අදාලව, ප්‍රියමනාප පාසලක උපරිම සේවා කාලය වසර 08 කට වඩා ප්‍රියාමනාප පාසලක උපරිම සේවා කාලය වසර 06 කටද සමා කර තිබුණත් මාතලේ අධ්‍යාපන කාර්යාලයට අයත් පළාත් සභා පාසල් 82 කද, නාඋල කලාපයට අයත් පාසල් 32 කද, ගුරුභවතුන් 524 දෙනෙකු ඉහත උපරිම සේවා කාල පිළිබඳව නොසලකා වසර 10 සිට 34 දක්වා කාලයක් එකම පාසලේ සේවය කරමින් පැවතුණි. එසේම නුවරඑළිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත පාසල්වල ගුරුභවතුන් 79 දෙනෙකු වසර 08 කට අධික කාලයක්ද, හඟුරන්කෙත කලාපයේ බාලිකා විද්‍යාලයක ගුරුභවතුන් 21 දෙනෙකුද, වසර 06 ත් 18 ත් අතර කාලපරාසයක්ද එකම පාසලේ සේවය කරමින් පැවතුණි. |

| | |
|---|---|
| 1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 43:2 ඡේදය | සෑම ලියාපදිංචි සමූපකාර සමිතියක්ම වාර්ෂික ශුද්ධ ලාභයෙන් රු.5 කට නොඅඩු සහ 10% කට නොවැඩි මුදලක් සමූපකාර අරමුදලට වාර්ෂික දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වුවත්, මධ්‍යම පළාත තුළ ලියාපදිංචි සමූපකාර සමිති 431 ක් වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට රු.34,091,800 ක දායක මුදල් හිඟහිටව පැවතුනි. |

(vii) **<u>2000 අංක 01 දරන මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය</u>**

| | |
|---|---|
| 6 සහ 19 (ආ) වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මාර්ග බලපත්‍ර නිකුත් කළයුතු වුවද එයට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලසීමාව තුළ මාර්ග බලපත්‍ර 142ක් නිකුත් කර තිබුණි. |

| | |
|---|---|
| (viii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | කිසියම් කොන්ත්‍රාත්තුවක වැඩ අවසන් කර භාරයට ගැනීමෙන් පසුව එහි රැඳවුම් මුදලින් 50% ක් නිදහස් කළහැකි වුවද එයට පටහැනව ප්‍රධාන පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම් කර්මාන්තයේ අදියර I හි ඒකක 1,2,3 ට අදාලව වැඩ අවසන් කර නොතිබියදීත් මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂකගේ නිර්දේශය මත 2011 දෙසැම්බර් 28 දින රු.22,328,723 ක රැඳවුම් මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. ඊට අදාල වැඩ නිමැවුම් වාර්තාවක් ඇතිව වුවද ගෙවිය හැකි වන්නේ 5% ක මුදලක් වන රු.19,980,000 ක් වුවද රු.22,328,723 ක මුදලක් ගෙවීමෙන් රු.2,348,723 ක රැඳවුම් මුදල් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවා තිබුණි. |

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.1,114,308,964 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.79,347,439 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ රු.1,034,961,525 ක වර්ධනයක් ඇතිවී තිබුණි.

## 2.2 <u>ආදායම් හා වියදම්</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

**ආදායම**

| | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පළාත් සභා විෂයන්ට අදාල ආදායම්** | | | | | | |
| බදු ආදායම් | 3,324,845,000 | 3,685,121,035 | (360,276,035) | 3,031,850,000 | 2,668,851,691 | 362,998,309 |
| බදු නොවන ආදායම් | 325,155,000 | 941,317,077 | (616,162,077) | 348,150,000 | 322,880,166 | 25,269,834 |
| රජයේ ප්‍රදාන | 17,947,529,836 | 16,028,726,530 | 1,918,803,306 | 16,087,468,591 | 15,774,747,134 | 312,721,457 |
| | 21,597,529,836 | 20,655,164,642 | 942,365,194 | 19,467,468,591 | 18,766,478,991 | 700,989,600 |

| | වියදම | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2011 | | | 2010 | | |
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පුනරාවර්තන වියදම** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 14,155,870,094 | 14,127,954,312 | 27,915,782 | 12,961,780,572 | 12,837,315,322 | 124,465,250 |
| අනෙකුත් | 2,870,629,876 | 2,798,516,870 | 72,113,006 | 3,297,583,685 | 3,008,433,206 | 289,150,479 |
| උප එකතුව | 17,026,499,970 | 16,926,471,182 | 100,028,788 | 16,259,364,257 | 15,845,748,528 | 413,615,729 |
| ප්‍රාග්ධන වියදම් | 4,571,029,864 | 2,614,384,495 | 1,956,645,369 | 3,618,438,759 | 2,841,356,023 | 777,082,736 |
| | 21,597,529,834 | 19,540,855,677 | 2,056,674,157 | 19,877,803,016 | 18,687,104,551 | 1,190,698,465 |

සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම රු.19,540,855,677ක් විය. ඉන් 87% ක් පුනරාවර්තන වියදම් වූ අතර 13% ක් මූලධන වියදම් විය.

## 2.3 ආදායම් පරිපාලනය

ඉදිරිපත් කර තිබුණු ගිණුම් අනුව පසුගිය වර්ෂ 03 ක ආදායම පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | |
|---|---|---|---|
| | **2011** | **2010** | **2009** |
| | රු. | රු. | රු. |
| බදු ආදායම | 3,685,121,035 | 2,668,851,691 | 2,337,135,037 |
| බදු නොවන ආදායම | 941,317,077 | 332,880,166 | 370,343,758 |
| | 4,626,438,112 | 3,001,731,857 | 2,707,478,795 |
| | ========== | ========== | ========== |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2011 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා ආයතනය -(පාසැල් කාර්ය මණ්ඩලය හැර)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,217 | 1,270 | - | 53 |
| තෘතියික මට්ටම | 4,392 | 3,961 | 431 | - |
| ද්විතික මට්ටම | 3,539 | 2,700 | 839 | - |
| ප්‍රාථමික මට්ටම | 4,581 | 4,292 | 289 | - |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 524 | - | 524 |
| | 13,729 | 12,747 | 1,559 | 577 |
| | ===== | ===== | ==== | ==== |

(ආ) <u>පාසල් කාර්ය මණ්ඩලය</u>

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විදුහල්පති | 1,753 | 1,215 | 538 |
| ගුරුභවතුන් | 28,653 | 25,756 | 2,897 |
| | 30,406 | 26,971 | 3,435 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. කටුගස්තොට කලාප අධ්‍යාපන කාර්යාලය යටතේ ඇති පාසල් 37 ක ගුරු පුරප්පාඩු 62 ක්ද, 2011 සැප්තැම්බර් 01 දිනට නාඋල අධ්‍යාපන කලාපයේ පාසල් 23 ක ද්විතීය අංශයේ ගුරු පුරප්පාඩු 86 ක්ද, පාසල් 36 ක ප්‍රාථමික අංශයේ ගුරු පුරප්පාඩු 72 ක්ද, විෂයයන් 20 කට අදාලව ගුරු උපදේශක පුරප්පාඩු 20 ක්ද, වලපනේ කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරු පුරප්පාඩු 102 ක්ද, කොත්මලේ කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරු පුරප්පාඩු 78 ක්ද, හඟුරන්කෙත කලාප කාර්යාලයේ ගුරු පුරප්පාඩු 330 ක්ද පැවති අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. තෙල්දෙණිය කලාපයට අයත් වැල්ගහවාඩිය ප්‍රාථමික විදුහල ළමුන් නොමැතිවීම නිසා වසාදමා තිබූ අතර 2011 අගෝස්තු 02 දින සිට විගණන අවස්ථාව වූ 2012 මාර්තු 01 දින දක්වා රාජකාර් ඉටුකළ බවට කිසිදු ලිඛිත ලියවිල්ලක් නොමැතිව එහි වැඩබලන විදුල්පතිවරයා හට වැටුප් වශයෙන් රු.154,098 ක් ගෙවා තිබූ අතර, එම කලාපයට අයත් තලගුනේ ප්‍රාථමික විදුහලද ළමුන් නොමැතිවීම හේතුවෙන් 2011 සැප්තැම්බර් 06 දින වසාදමා තිබුණද, එම විදුහලේ වැඩබලන විදුහල්පතිනියටද කිසිදු කාර්‍යයක් ඉටු නොකර වැටුප් ලෙස එදින සිට 2012 පෙබරවාරි දක්වා රු.163,183 ක මුදලක් ගෙවා තිබුණි.

2.4.2 <u>වෙනත් ආයතන වලට මුදාහල මානව සම්පත්</u>

ආයතනවල අනුමත කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන නිලධාරීන් පත්කළයුතු වුවද, ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මාර්ග පරීක්ෂකවරයකු 2009 වර්ෂයේ සිට ප්‍රධාන අමාත්‍යාංශයටද, සංස්කෘතික දෙපාර්තමේන්තුවේ වැඩසටහන් සහකාරවරයකු හා සංස්කෘතික නිලධාරීවරයකු 2009 වර්ෂයේ සිට ශ්‍රී දළදා මාලිගාවට හා ප්‍රධාන අමාත්‍යාංශයටද මුදාහැර තිබුණි.

2.5 **වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.5.1 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

පහත විග්‍රහ කර ඇති පරිදි භෞතික සම්පත් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් ස්වභාවය | සංඛ්‍යාව/ වර්ග ප්‍රමාණය | වටිනාකම | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|
| | | රු. | |
| (අ) ඉඩම් | අක්කර 17 රූඩ් 3 පර්.29 | සොයාගත නොහැක | වසර 05 ක් පමණ |
| (ආ) ගොඩනැගිලි (ගුරු නිවාස) | 111 | - එම - | වසර 03 - 05 |
| (ඇ) වාහන | 01 | 225,000 | වසර 05 ක් පමණ |
| (ඈ) යන්ත්‍රෝපකරණ | 136 | සොයාගත නොහැක | වසර 03 - 05 |
| (ඉ) කාර්යාල උපකරණ | 01 | 29,400 | වසර 02 ක් පමණ |
| (ඊ) වෙනත් | 2250 | 242,736 | වසර 03 - 05 |

2.5.2 **සමීක්ෂණය නොකල වත්කම්**

මු.රෙ.756 ප්‍රකාර පාසල් 271 ක සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

2.5.3 **අචල ජංගම වත්කම්**

2011 දෙසැම්බර් 31 දිනට අවු.01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම්වල අගය රු.368,492ක් විය.

2.5.4 **ලැබිය යුතු ගිණුම්**

2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.1,608,851 ක් වූ අතර ඉන් අවු.01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.326,801 ක් විය.

### 2.5.5 අයවීමට ඇති සේවක ණය

2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.688,582,335 ක් වූ අතර අවු.01 ක කාලයක් ඉක්මවා තිබුණු හිඟහිටි ශේෂවල එකතුව රු.122,187,987 ක් විය.

### 2.6 හඳුනාගත් පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී සහ ආයතනයන්හි පවත්වා තිබූ තොරතුරු අනුව පහත සඳහන් පාඩු හා හානි අනාවරණය විය.

(අ) පළාත් සභාව සතු වාහන 11 ක් අනතුරුවලට භාජනයවීමෙන් රු.2,833,167 ක අලාභයක්ද, පළාත් සභා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 04 ක් යටතේ පැවති දේපල 16 කට සිදුවී තිබූ රු.31,584,693 ක හානිද සම්බන්ධයෙන් මු.රෙ.103, 104 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පවතින පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිල්ලෙහි මහල් 02 ක් පරිගණක පන්ති පැවැත්වීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 50% ක ලාභ ප්‍රතිශතයක් ලබා ගැනීමේ එකඟතාවය මත වර්ෂ 03 ක කාල සීමාවකට අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඉහත අවබෝධතා ගිවිසුම ආරම්භයේ රු.4,469,596 ක මුදලක් එම ආයතනය වෙත ගෙවා තිබුණද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ 2010 නොවැම්බර් සිට විගණන පරීක්ෂණයට භාජනය කළ 2012 අගෝස්තු දක්වා මාස 22 ක කාල සීමාව අවසාන වනවිට අමාත්‍යාංශය වෙත ලැබී තිබුණේ රු.1,929,988 ක සමුච්චිත ලාභයක් පමණි. ඒ අනුව ගිවිසුම් කාලයෙන් 2/3 කට ආසන්න කාලයක් ගතවී තිබියදීත් වියදමට සාපේක්ෂව ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ඇ) පල්ලේකැලේ ආයුර්වේද නිෂ්පාදනාගාරයේ රු.8,629 ක් වටිනා නිමි ඖෂධ වර්ග 05 ක්ද, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් රෝහල් 9 ක රු.869,056 ක් වටිනා ඖෂධ වර්ග 187 ක හා නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල ගබඩාවේ පැවති රු.2,777,124 ක් වටිනා ඖෂධ අයිතම 242 ක්ද කල් ඉකුත්වී පැවතුණි.

(ඈ) මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ප්‍රඥප්තියට පටහැනිව සේවකයන් බඳවා ගැනීම හා අධිකාරිය විසින් වගකීමෙන් තොරව කටයුතු කිරීම හේතුවෙන් අධිකාරියට විරුද්ධව පවරා තිබූ නඩුවක් සඳහා සේවක වන්දි ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියට සිදුවූ පාඩුව රු.626,400 ක් විය.

(ඉ) නුවරඑළිය ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති කාර්යාල ගොඩනැගිල්ල හා මධ්‍යම පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු මුල් කොන්ත්‍රාත්කරුවන් විසින් පැහැරහැරීම නිසා ඔවුන් වෙත ගෙවන ලද වැඩ ඇරඹීමේ අත්තිකාරම් මුදල හා නඩු ගාස්තු රු.10,349,184 ක ප්‍රමාණයක් පළාත් සභාව වෙත අයවී නොතිබුණි.

2.7 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් 2011 වර්ෂය සඳහා රු.163,296 ක වැය කර පුවත් පත් දැන්වීම් පළ කර මුද්‍රණකරුවන් ලියාපදිංචි කර තිබුණත් වර්ෂය තුළ රු.416,050ක් වූ මුද්‍රණ කටයුතු එම ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ඉටුකරගෙන නොතිබුණි.

(ආ) නුවරඑළිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් කාමර 05 කින් යුත් සංචාරක නිවාසය 2000 වර්ෂයේ සිටම කලාපයේ කාර්යාල කාර්ය සහයක මහතෙකු හා ඔහුගේ පවුලේ අය වෙනුවෙන් කිසිදු කුලී අය කිරීමකින් තොරව වෙන්කර දී තිබුණි. 2005 සිට 2011 වර්ෂය දක්වා එම නිවසේ විදුලි බිල් වශයෙන් රු.150,721 ක මුදලක් පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි.

2.8 <u>අවිධිමත් ගනුදෙනු</u>

2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙන් ත්‍රිපෝෂ මළු 12192 ක් නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලදීගෙන තිබුණද, ඉන් රු.5,962,950 ක් වටිනා ත්‍රිපෝෂ මළු 1893 ක් එම කාර්යාලය මගින් බෙදාදී ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබණි.

2.9 <u>මතභේදයට තුඩුදෙන ගනුදෙන</u>

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ මතභේදයට තුඩුදෙන හෝ ප්‍රශ්නකාරී ස්වරූපයක වූ ගනුදෙනු පහත දැක්වේ.

(අ) උඩදුම්බර සිද්ධාර්ථ ප්‍රාථමික විද්‍යාලය ආරම්භ කිරීම සඳහා බ්‍රෝඩ්වේ ඇපරල් ආයතනය සතු දේපල මිලදී ගැනීම වෙනුවෙන් රු.20,000,000 ක මුදලක් 2010 දෙසැම්බර් 31 දින උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණද 2012 නොවැම්බර් 20 දින වනවිට වසර දෙකකට ආසන්න කාලයක් ගතවී තිබුණද, අදාල මිලදී ගැනීම සිදුනොකර එම මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දවුලගල ග්‍රාම නිලධාරි වසමේ උඩුනුවර සී.ස.සමුපකාර සමිතියට දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දී තිබුණු ඉඩමක් වෙනුවෙන් 2011 වර්ෂය අවසානය වනවිට අයවිය යුතු හිඟ බදු මුදල රු.314,300 ක් විය.

2.10 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) දොළුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක් 1998 වර්ෂයේ සිට පෞද්ගලික ආයතනයක් වෙත රු.120,000 ක් වූ වාර්ෂික බදු මුදලක් හා රු.360,000 ක වාර මුදලක් මත දීර්ඝකාලීන බදු පදනම මත ලබාදී තිබූ අතර 2011 දෙසැම්බර් 31 දින වනවිට එම ආයතනයෙන් බදු මුදල්, වාර මුදල් හා දඩ මුදල් වශයෙන් රු.930,490 ක මුදලක් අයවියයුතුව තිබුණි. විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2012 ඔක්තෝබර් 16 දින වනවිටත් ඉඩමේ භුක්තිය ලබාදී වසර 14 ක් පමණ ගතවී තිබුණද බදුකරයක් ලබාදී නොතිබීම හේතුවෙන් මුදල් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) උඩුනුවර ප්‍රාදේශීය රෝහලේ ඖෂධාගාරයේ පැවති කල් ඉකුත් වූ ඖෂධ වර්ග 04 ක් විගණිත දිනය වූ 2011 ජූලි 19 දින වනවිටත් බාහිර රෝගී අංශයේ රෝගීන්ට හා නේවාසික රෝගීන්ට නිකුත් කරමින් පැවති අතර මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වෛද්‍ය සැපයීම් අංශය 2011 වර්ෂයේදී රු.529,056 ක් වටිනා තත්ත්වයෙන් අසමත් ඖෂධ (Qulity Fail Drugs) වර්ග 18 ක් රෝගීන්ට නිකුත් කර තිබුණි.

2.11 <u>කාර්ය සාධනය</u>

2.11.1 <u>රජයේ ප්‍රදාන</u>

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ප්‍රභවය | රජයේ ප්‍රදාන ලැබීම් | වියදම |
|---|---|---|---|
| | | රු. | රු. |
| i. | උපමාන පාදක | 337,300,000 | 400,419,141 |
| ii. | පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,172,150,000 | 1,879,875,142 |
| iii. | සාමූහික ප්‍රදාන | 13,696,516,000 | 13,696,516,000 |
| iv | වෙනත් ප්‍රදාන | 822,760,530 | 294,800,950 |
| | | 16,028,726,530 | 16,271,611,233 |

2.11.2 **පළාත් සංවර්ධන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ යටතේ රු.1,712,566,290 ක අගයකට වූ වැඩ යෝජනා 5653 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|
| i. සම්පූර්ණයෙන් නිමකල | 5052 | 345 | 5397 |
| ii. 50% කට වඩා අඩුවෙන් නිමකල | 112 | 09 | 121 |
| iii. 50% කට වඩා වැඩියෙන් නිමකල | 20 | 12 | 32 |
| iv. ආරම්භ කර නොතිබූ | 67 | - | 67 |
| v. මතභේදයට/ප්‍රශ්නකාරී තත්වයන් යටතේ වූ | 36 | - | 36 |
| එකතුව | 5287 | 366 | 5653 |

2.12 **කොන්ත්‍රාත් පරිපාලනය**

2.12.1 **ව්‍යාපෘති/ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද**

පහත දැක්වෙන ව්‍යාපෘති/ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට ලැබුණි.

| ව්‍යාපෘති යෝජනා ක්‍රමය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කල දිනය | නිමකිරීමට ඉලක්ක කල දිනය | 2011 දෙසැම්බර් 31 දින දක්වා දරන ලද වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| මධ්‍යම පළාත් ප්‍රධාන පරිපාලන සංකීර්ණය | 621,866,055 | 2006.11.02 | 2011.12.31 | 966,202,533 | ඉදිකිරීම් කටයුතු විධිමත් පරිදි ඉටු නොකිරීම, පළාත් |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඉදිකිරීම (අදියර I හා II) | | | | | සභාවේ දුර්වල අධීක්ෂණය |
| හාරිස්පත්තුව මාපාමඩුල්ල තල්ගස් කොටුව විදුලි දිගුව | 126,000 | 2011.12.26 | 2011.12.31 | 126,000 | විදුලි සම්බන්ධතාවය ලබාදී නොදීම. |
| දිගන ක්‍රීඩාංගනය ඉදිකිරීම | 338,837,588 | 2009.09.03 | 2011.02.28 | 175,759,432 | කොන්ත්‍රාත්කරු වෙත නිසි උපදේශන සේවාවක් නොලැබීම හා ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් සේවක පිරිස් යොදා නොගැනීම |

2.12.2 <u>සම්පූර්ණයෙන් අත්හැර දමා ඇති ව්‍යාපෘති/ යෝජනා ක්‍රම</u>

පහත දැක්වෙන ව්‍යාපෘති/ යෝජනා ක්‍රම සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණි.

| **ව්‍යාපෘතිය/ යෝජනා ක්‍රමය** | **ඇස්තමේන්තු ගත පිරිවැය** | **ආරම්භ කළ දිනය** | **2011 දෙසැම්බර් 31 දින දක්වා දරන ලද වියදම** | **අත්හැර දැමීමට හේතුව** |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| **<u>උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>** | | | | |
| වටදෙණිය ගොනාධිකය පාර සංවර්ධනය | 35,000 | ආරම්භ කර නොමැත | වියදම් දරා නොමැත | ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| මාත්ගමුව රජමහා විහාරයේ විහාර මන්දිරයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා | 25,000 | - එම - | - එම - | දැනුවත් කලත් ඉල්ලීම් ඉදිරිපත් කළ පාර්ශ්වය පැමිණ නැත |
| පල්ලේ අළුදෙණිය කළුකුණ්ඩා කුඹුරේ සිට රම්මා කඩේ දක්වා මාර්ගය සකස් කිරීම. | 25,000 | - එම - | - එම - | - එම - |
| වෙලම්බොඩ මුසලිම් මධ්‍ය මහා විද්‍යාලයේ නාමපුවරුවේ ඉතිරි කොටස ඉදි කිරීම | 30,000 | - එම - | - එම - | ඉල්ලුම්කරුවන් දැනුවත් කර ඇතත් ක්‍රියාත්මක කර නොමැත. |
| ගෙලිඹය පාහියන්ගමුව මාර්ගයේ සමගි මාවත අළුත්වැඩියා කිරීම | 30,000 | - එම - | - එම - | ඇස්තමේන්තු සකස් කලද වැඩ ආරම්භ නොකිරීම |

<u>යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

| | | | | |
|---|---|---|---|---|
| යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලියාපදිංචි සුභසාධන සමිති කාන්තා සමිති වලට උපකරණ ලබාදීම. | 60,000 | - එම - | - එම - | 2011.12.28 වන දින යෝජනාව ලැබී ඇති බැවින් කාලය ප්‍රමාණවත් නොවීම |
| යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුද්ගලයින් 04 දෙනෙකුට ස්වයං රැකියා සඳහා ඇදුම් මැසීමට මහන මැෂින් ලබාදීම. | 40,000 | - එම - | - එම - | ප්‍රතිලාභීන් ඉදිරිපත් නොවීම |
| උඩරත්මීවල ග්‍රාමයට ඇතුලුවන මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 50,000 | - එම - | - එම - | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| මල්ගම්මන හන්දියේ සිට ගිරාගම ගොරකාංග මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම II අදියර | 100,000 | - එම - | - එම - | අවලංගු කිරීම |
| මල්ගම්මන හන්දියේ සිට ගිරාගම ගොරකාංග මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම III අදියර | 100,000 | - එම - | - එම - | - එම - |
| ඒදඩුවාව නැගෙනහිර වසමේ අතුරු මාර්ගය කොටසක් පිළිසකර කිරීම | 100,000 | - එම - | - එම - | - එම - |
| මල්ගම්මන හන්දියේ සිට ගිරාගම ගොරකාංග මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම I අදියර | 100,000 | - එම - | - එම - | - එම - |
| පිළිමතලාව ගිරාගම නරිඅංග වෙල්යායට යන ඇල මාර්ගය සකස් කිරීම II අදියර | 50,000 | - එම - | - එම - | - එම - |
| ගිරාගම නරිඅංග වෙල්යායට යන ඇල මාර්ගය සකස් කිරීම | 30,000 | | | - එම - |
| <u>ගළවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u> | | | | |
| පහලතැන්න කුඹුර නවුසාඩ් මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 50,000 | | | ක්‍රියාත්මක නොකරන බව ප්‍රා.සභාව දන්වා තිබීම. |
| <u>අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය</u> | | | | |
| අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ, ලොයිනොන් වත්ත නෝන්කොව් කොටසට විදුලි | 50,000 | | | ගිණිගත්හේන විදුලි ඉංජිනේරු වෙත ඇස්තමේන්තුවක් සකස් කර එවන මෙන් ඉල්ලීමක් කර ඇතත්, එසේ එවා |

| | | |
|---|---|---|
| සැපයිම | | නොමැතිවීම. |
| පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව කිරි අලෙවිසැල් ඉදිකිරීම | එක් අලෙවිසැලකට ර.100,000 | අලෙවිසැලකට රු.100,000 කට වඩා වැඩි මුදලක් වැයවීම |

2.12.3 <u>ඉදිකිරීම්</u>

ඉදිකිරීම් කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණවලදී දක්නා ලද අඩුපාඩු පහත දැක්වේ.

(අ) මහනුවර පල්ලේකැලේ ඉදිකරමින් පවතින මධ්‍යම පළාත් ප්‍රධාන පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ කර්මාන්තයේ අදියර I සහ II ට අදාල ගිවිසුම්ගත කොන්ත්‍රාත් වටිනාකම රු.621,866,055 ක් වුවද ඊට අදාල වැඩ නිම නොකර තිබියදී 2012 සැප්තැම්බර් 30 දින වනවිට කොන්ත්‍රාත් සමාගම වෙත රු.892,564,571 ක මුදලක් ගෙවා තිබීමෙන් ගිවිසුම්ගත මුදල ඉක්මවා රු.270,698,516 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. එසේම අදියර I සඳහා ප්‍රමාද ගාස්තු රු.16,310,000 ක්ද අදියර II සඳහා ප්‍රමාද ගාස්තු රු.13,365,000 ක්ද වශයෙන් රු.29,675,000 ක මුදලක් අයවිය යුතුව තිබුණද 2012 සැප්තැම්බර් 30 දින වනවිට අයකර තිබුනේ රු.4,850,000 ක මුදලක් පමණි.

(ආ) පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් රාසිංගොල්ල තෙරපැහැ මාර්ගය ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය කාපට් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 905 ක් වුවද අධිකාරිය විසින් සකස් කරන ලද බිල්පත්හි මෙම මාර්ගය සඳහා කාපට් මෙට්‍රික් ටොන් 1015.76 ක් යොදූ බවට කාර්මික නිලධාරි විසින් වාර්තා සකස් කර තිබීම හේතුවෙන රු.1,157,244 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි.

2.13 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

පළාත් සභාවේ මූල්‍ය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) කර්මාන්ත ඉදිකිරීම්

(ආ) ගබඩා පාලනය

(ඇ) වාහන උපයෝජනය